# පොත් ගුල් ලෙන් ලිපිවලින් අනාවරණය වන බස්නාහිර පළාතේ ඓතිහාසිකත්වය

නිලන්ති බණ්ඩාර
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

## ABSTRACT

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අලවල උතුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පොත්ගුල් ලෙන ප්‍රාග් ඓතිහාසික වශයෙන් මෙන්ම ඓතිහාසික වශයෙන් ද සුවිශේෂී වැදගත්කමක් ගන්නා ස්ථානයකි. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් සිදුකළ පුරාවිද්‍යා පර්යේෂණ මගින් වසර 13000 ක පමණ සිට ඓතිහාසික යුගය දක්වා භාවිත වූ බවට විශ්වාස කරන මානව හිස්කබල් කොටස්, මානව හා සත්ත්ව දත්, ගොළුබෙලි විශේෂවල සාධක, විශාල වශයෙන් ක්ෂිරපායී සතුන්ගේ අස්ථි අවශේෂ, ප්‍රාග් මානවයා පරිහරණය කළ ගල්, සත්ත්ව ආයුධ, හා එතෙක් ප්‍රකාශයට පත් නොවූ ලෙන් ලිපි ඇතුලු වැදගත් සාධක ප්‍රමාණයක් හමු විය.

බස්නාහිර පළාත තුළ ශිලාලේඛන 62 ක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අනාවරණය කරගෙන ලියාපදිංචි කර ඇත. ඉන් ලිපි 6 ක් ලෙන් ලිපි ය. මෙම ලෙනෙන් සොයාගනු ලැබූ ලිපි 2 ත් එකතුව ගත් කළ ලෙන් ලිපි 8 ක ප්‍රමාණයක් දැනට අනාවරණය වී තිබේ. මෙම ලෙන් ලිපි දෙක තුළින් එතෙක් බස්නාහිර පළාතේ අනාවරණය වී නොතිබුණ පූර්ව රාජ්‍ය අවධියේ පාලන නායකත්වය දැරූ ගමික (ගම්පති) තනතුරක් පිළිබඳව සහ දේව නැමැත්තෙකු විසින් කරවන ලද ඇළක් පිළිබඳව කියවෙයි. මේ අනුව පැහැදිලිවන්නේ බස්නාහිර පළාතේ මූල් කාලයේ බුදු දහමේ ආලෝකය ලැබීමත් සමඟ ම ක්‍රියාකාරී වූ බෞද්ධාගමික වටාපිටාව හා දේශපාලනික යාන්ත්‍රනයේ ස්වරූපයයි. මෙතෙක් අනාවරණය නොවූ නව්‍ය ඓතිහාසිකත්වය අනාවරණය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් සිදු වේ.

**ප්‍රමුඛ පද** :- ඓතිහාසිකත්වය, ලෙන් ලිපි, බස්නාහිර පළාත, ගමික, ප්‍රාග් ඓතිහාසික යුගය